2025 මාර්තු 6

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,

6/5, ලෙයාර්ඩ්ස්පාර,

කොළඹ 5

ගරු සරෝජා පෝල්රාජ් මහත්මිය

කාන්තා හා ළමා කටයුතු ඇමතිණී,

5 වන මහල,

සෙත්සිරිපාය II වන අදියර,

බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

ගරු අමාත්‍යතුමියණි,

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කොට ගනිමින්  කාන්තාවන් සවිබලගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ස්ථාපිත කිරීම සඳහා කඩිනම් නීති සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කෙරෙහි වහාම අවධානය යොමු කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන් මවිසින් උදක් ම ඉල්ලා සිටියි. විශේෂයෙන් මෙම වසරේ පෙබරවාරි මස කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුති සමුළුවේ මැදිහත්වීම අතරතුර, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ පෙරට ගෙන යාම සඳහා ඔබ දැරූ උත්සාහයන් අපි හඳුනා ගත්තෙමු. කෙසේ වුවද, වසර ගණනක් මුළුල්ලේ දිවයින පුරා බිම් මට්ටමේ ප්‍රජාවන් සමඟ වැඩ කටයුතු කිරීමේ දී  අප විසින් අත්විඳ ඇති මූලික යථාර්ථයන් සලකා බලන විට, මේ සම්බන්ධයෙන් කළ යුතු බොහෝ දේ ඇති බව අපගේ හැඟීමයි.

ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ සුළුතර සමාජභාවී කණ්ඩායම් මුහුණ දෙන බහු-මාන අවදානම් ආමන්ත්‍රණය කෙරෙන මැදිහත්වීම් මෙහෙයවීම සඳහා ඔබේ නායකත්වය මේ මොහොතේ අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරන්නෙමු. වසර 2024 නොවැම්බර් මස සිට 2025 පෙබරවාරි මස දක්වා කාලය තුළ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අතිගරු ජනාධිපති දිසානායක මහතා සහ අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා වෙත ලිපි යොමු කරමින් මෙකී අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළු සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා ඉදිරි මාස කිහිපය තුළ සිදු කළ යුතු  මූලික මැදිහත්වීම් සම්බන්ධ කරුණු ඉස්මතු කරන ලදී.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කාන්තාවන් සහ අනෙකුත් ආන්තික හා අවදානමට ලක් විය හැකි කණ්ඩායම් සමඟ අඛණ්ඩව කටයුතු කරන  අතර, මෙරට ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හැඩගැස්වීමේ දී විවිධ පාර්ශවකරුවන් විනිවිදභාවයෙන් යුතුව සම්බන්ධ කර ගැනීමේ වැදගත්කම එහි දී අවධාරණය වී තිබේ. විවිධ දෘෂ්ටිකෝණයන් සලකා බලන සහයෝගී ප්‍රවේශයන් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හා සම්බන්ධ  මුලපිරීම්වල කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට හේතු විය හැකි ය.

මේ අනුව, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික අයිතිවාසිකම් උදෙසා මැදිහත්වීම් අවශ්‍ය යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෙස අප විශ්වාස කරන ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධ කරුණු මෙම ලිපියෙහි

ඇමුණුම් ලෙස ඉදිරිපත් කොට තිබේ. මෙකී ක්ෂේත්‍ර පහත සඳහන් රාමු ත්‍රිත්වය යටතේ වර්ගීකරණය කර ඇත: (1) නීති ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්; (2) ඉඩම්, ජීවනෝපාය සහ ස්වභාවික සම්පත් වෙත ඇති ප්‍රවේශය ඇතුළු සමාජ-ආර්ථික අයිතිවාසිකම්; සහ (3) නියෝජනය, සංහිඳියාව සහ අනන්‍යතාවය. ඒ අනුව ඉදිරියේ දී ගෙන එනු ලබන ව්‍යවස්ථාදායක සහ ප්‍රතිපත්තිමය න්‍යාය පත්‍රයන්ට සිදු කෙරෙන මැදිහත්වීම්වල දී මෙකී ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෙස අප ඔබේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින අතර සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ අභිලාෂයන් පිළිබිඹු කෙරෙන යුක්තිගරුක පද්ධතියක් ගොඩනැගීමට කඩිනම් පියවර ගනු ඇතැයි බලාපොරොත්තු වන්නෙමු. මෙම කරුණු ඔබ සමඟින් තවදුරටත් සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබෙනු ඇතැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෙස අප උදක් ම බලාපොරොත්තු වන අතර ශ්‍රී ලංකාව පරිවර්තනීය වෙනසක් වෙත රැගෙන යාම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පෙරට ගෙන යාම අරමුණු කොට ගත් ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම පිණිස අපගේ අඛණ්ඩ සහයෝගය ලබා දෙන බව ද මෙසේ ප්‍රකාශ කොට සිටින්නෙමු.

අප විසින් යොමු කරනු ලබන මෙකී ලිපියට පිළිතුරු ලිපියක් කාරුණිකව අප වෙත යොමු කරන මෙන් ඔබ තුමිය වෙතින් ඉතා ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටින අතර, මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගනු ලබන ධනාත්මක පියවර දැකීමට ද අපි බලාපොරොත්තු වෙමු.

මෙයට විශ්වාසී,



ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

විධායක අධ්‍යක්ෂ

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 05, Sri Lanka
Tel: +94 11 2081384-6, 5552746, 5552748 | Fax: +94 11 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

**නීතිමය සහ ප්‍රතිපත්තිමය න්‍යාය පත්‍රය සඳහා අවශ්‍ය වනමැදිහත්වීම්**

| නීති ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් | |
|---|---|
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ** | ● විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම, ඉහළ මට්ටමේ වගවීම ඇතුළුව බලතල සංවරණය හා තුලනය කෙරෙන විධිවිධාන මෙන් ම වැඩිදියුණු කළ අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළු ප්‍රධාන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම. මෙයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාව ඉවත් කිරීම ඇතුළත් වේ. |
| **ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පවතින නීති ප්‍රතිසංස්කරණය කිරීම** | ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පවතින දණ්ඩන නීති පරීක්ෂා කොට යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයක් පවතී.[1] මෙයට:<br>● වින්දිතයින්ට නිසි ආරක්ෂාවක් ලබා දීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ ස්ත්‍රී දූෂණය යන වරද සම්බන්ධ ප්‍රතිපාදන සංශෝධනය කිරීම.<br>● ගැබ් ගැනීම අවසන් කිරීම අපරාධයක් නොවන බවට පත් කිරීම.<br>● ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මෙන් ම පෞද්ගලිකත්වය සහ නිදහස සඳහා වන අයිතිවාසිකම්වලට ගරු කරන බව සහතික කිරීම පිණිස, විශේෂයෙන් වැඩිහිටියන් අතර අන්‍යෝන්‍ය කැමැත්ත සහිතව පුද්ගලික අවකාශයන් තුල සිදුවන ලිංගික ක්‍රියාවන් අපරාධයක් බවට පත් නොවන ලෙස දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365(අ) වගන්ති ඉවත් කළ යුතු ය.<br>● වින්දිතයින්ට ලබා දී ඇති ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත සංශෝධනය කළ යුතු ය.<br>● මාර්ගගතව සිදුවන ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙහි ආකාර ප්‍රමාණවත් ලෙස විමර්ශනය කොට නඩු පැවරීම සඳහා නව නීති හඳුන්වා දීම.<br>● වින්දිතයින් මුහුණ දෙන කම්පනය සහ නැවත වින්දිතභාවයට පත්වීම අවම කිරීම උදෙසා ලිංගිකත්වය සහ ස්ත්‍රී |

[1] "Legal Reform to Combat Sexual and Gender based Violence" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්). https://www.cpalanka.org/wp-content/uploads/2020/11/Law-Reform-to-combat-SGBV-PART-1-General-Centre-for-Policy-Alternatives.pdf

| | |
|---|---|
| | පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව කඩිනමින් සහ පුද්ගලික මට්ටමින් නඩු පැවරීමට ඉඩ සලසන පරිදි කාර්යය පටිපාටික නීති යාවත්කාලීන කිරීම.<br>• 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.<br>• ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වින්දිතයින්ට නිසි ලෙස සහාය වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහ නඩු පවරන්නන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම.<br>• ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයින්ට පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයන් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම.<br>• ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩ ක්‍රියාවන් ඉහළ අනුපාතවලින් පැවතීමට මූලික හේතු විමර්ශනය කොට එවැනි සිදුවීම් වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ක්‍රියාත්මක කිරීම.<br>• ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව පුද්ගලයින්ට හිරිහැර කිරීමට සහ රඳවා තබා ගැනීම පිණිස උපකාරීවන පාදඩ (අයාල) ආඥා පනත සංශෝධනය කිරීම. |
| 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සහ යෝජිත සංශෝධන | • 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත අවලංගු කොට සියලු දෙනා ඇතුළත් කරගත් සහ විවිධභාවයෙන් යුක්ත වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට පියවර ගැනීම සහ ඒ සඳහා අනවශ්‍ය කලබලකාරීත්වයකින් තොරව බහුවිධ පාර්ශවකරුවන්ගේ අදහස් විවිධ දෘෂ්ටිකෝණවලින් ලබා ගැනීමට කටයුතු කිරීම.[2] |
| **කාන්තාවන්ගේ ආරක්ෂාවට සහ ගෞරවයට බලපාන ක්ෂුද්‍ර මූල්‍ය, ක්ෂුද්‍ර ණය සහ වෙනත් මූල්‍යමය ණය දීමේ ක්‍රම නියාමනය කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදන/ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම** | • ශ්‍රී ලංකාවේ සියලුම ආකාරවල මූල්‍ය ණය ලබා දීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර නියාමනය කෙරෙන ප්‍රමිතිගත නියාමන රාමුවක් ස්ථාපිත කිරීම සඳහා යෝජිත |

[2] "2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සම්බන්ධ ප්‍රකාශනය" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024 පෙබරවාරි ). https://www.cpalanka.org/statement-on-the-online-safety-act-no-09-of-2024/

| | |
|---|---|
| | ණය නියාමන අධිකාරී නීතිය වහාම බලාත්මක කිරීම.[3]<br>• ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය, ක්ෂුද්‍ර ණය සහ වෙනත් ආකාරවල මූල්‍යමය ණය දීමේ ක්‍රමවේදයන් හා සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම්වලට අදාළව බලාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සහිත ජාතික ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීම.<br>• 2016 අංක 16 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හෝ ඉදිරියේ දී සම්පාදනය කෙරෙන කිසියම් හෝ නීතිද ඇතුළුව ක්ෂුද්‍ර මූල්‍යකරණයට අදාළ සියලුම ආකාරයේ රෙගුලාසි පැනවීමේ දී අත්හල නොහැකි නිර්ණායකයක් ලෙස භාෂා අයිතිවාසිකම් තහවුරු කිරීම.<br>• දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සංඛ්‍යාලේඛන අංශය, මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සහයෝගයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය, ණය ගැට ලු හෝ වෙනත් අසාධාරණ ණය දීමේ ක්‍රමවේදයන් තුළ සිරවී සිටින කාන්තාවන් ඇතුළු සියලුම තැනැත්තන් පිළිබඳව සාක්ෂි මත පදනම්ව පුළුල් තක්සේරුවක් සිදු කිරීම. |
| 1951 අංක 13 දරන මුස්ලිම් විවාහ සහ දික්කසාද(සංශෝධිත) පනතට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම | • මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දීම මගින් සියලුම කාන්තාවන්ගේ සහ දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම. |

| සමාජ-ආර්ථික අයිතිවාසිකම් සඳහා ප්‍රවේශය | |
|---|---|
| ඉඩම්, ජීවනෝපාය සහ ස්වභාවික සම්පත් සඳහා ප්‍රවේශය | • ඉඩම් සම්බන්ධයෙන් කාන්තාවන්ට ඇති ප්‍රවේශය, හිමිකාරිත්වය සහ පාලනය සුරක්ෂිත කිරීම.<br>• විශේෂයෙන් විධිමත් නෛතික හිමිකම් නොමැතිව පරම්පරා ගණනාවක් මුළුල්ලේ ඉඩම් අයිතිය බුක්ති විඳිනු ලබන ප්‍රජාවන් ඇතුළු විවිධ පාර්ශවයන්ට ඉඩම් හිමිකාරිත්වය සම්බන්ධ නිල ලියකියවිලි ලබාගැනීමට ඇති ප්‍රවේශය පහසු කිරීම. මෙයට ලේඛන ක්‍රියාවලියට සහය වීම සහ නීති උපදෙස් ලබා දීම පිණිස ජංගම දැනුවත් |

[3] Brief Commentary on the pressing need for regulatory mechanism for money lending including microfinance in Sri Lanka" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2023 ජනවාරි).
https://citizenslanka.org/wp-content/uploads/2024/01/Micro-Finance-Policy-English.pdf

| | |
|---|---|
| | කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද ඇතුළත් වේ.<br>• හමුදාව ඇතුළු අනෙකුත් පාර්ශවයන් විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන සිටින ඉඩම් නිදහස් කිරීම. විශේෂයෙන් ස්ත්‍රීන් සහ ස්ත්‍රී මූලික පවුල්වලට එවැනි අත්පත් කරගැනීම්වලආර්ථික වැය බර දැරීමට සිදුවන බැවින් එය ජීවනෝපායයන්, ස්වභාවික සම්පත් සහ සංස්කෘතික උරුමයන් සඳහා ඇති අයිතියට බලපෑම් කරයි.<br>• දිගුකාලීන සැපයුම් දාම සහාය ස්ථාපිත කිරීම මෙන් ම දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් අමුද්‍රව්‍ය බෙදාහැරීමේ මාර්ග සහ වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට කාන්තාවන් බලගැන්වීම සඳහා සිවිල් සමාජ සංවිධාන සහ දේශීය සමුපකාර හෝ ව්‍යාපාර අතර හවුල්කාරිත්වයක් ගොඩනැගීම.<br>• කාන්තාවන් සේවයේ යොදවන හෝ කාන්තා ව්‍යවසායකත්වයෙන්[P] භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබනව්‍යාපාර සඳහා සහනාධාර සහ බදු දිරිගැන්වීම් ලබා දීම් |
| රැකියා අයිතිවාසිකම් | • යහපත් සේවා කොන්දේසි යටතේ සේවය කිරීමට කාන්තාවන්ට ඇති අයිතිය සහතික කිරීමට සහ කාන්තාවන් සඳහා ආරක්ෂිත සේවා ස්ථාන පවතින බවට සහතික කෙරෙන නියාමන රාමු සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට කඩිනම් පියවර ගත යුතු ය.<br>• බහුතරය කාන්තාවන් වන ගෘහ සේවකයන් සුදුසු කාර්යයන් හී නිරත කෙරෙන බවට සහතික කිරීම පිණිස සංයුක්ත පියවර ගත යුතු අතර, ගෘහ සේවක අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂයෙන් සම්පාදනය කොට ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුති අංක 189 අපරානුමත කිරීම ද මෙයට ඇතුළත් වේ.<br>• වැටුප් නොලබන රැකවරණ කටයුතු හේතුවෙන් කාන්තාවන් මත පැටවෙන අධික වැඩ බර සැලකිල්ලට ගනිමින්, කාන්තාවන් රැකියාවන් වෙත යොමු කිරීම දිරිමත් කිරීම සඳහා ඒකාබද්ධ රැකවරණ ප්‍රතිපත්ති ප්‍රවේශයක් සහ යටිතල පහසුකම් හඳුන්වා දීම.<br>• රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සංවර්ධනය කිරීම තුළින් කාන්තාවන්ට ප්‍රමාණවත් ව්‍යවසායක කුසලතා වර්ධනය කර ගැනීම සහ ආර්ථික අවස්ථාවන්ට ප්‍රවේශ වීමට ද ඒ හරහා |

| | |
|---|---|
| | සිය ආදායම් ශක්තිමත් කර ගැනීමට හැකි පරිදි ඔවුන්ව බලගැන්වීම සහ ඒ ඔස්සේ කාන්තාවන්ට ස්වයං රැකියා අවස්ථා ලබා ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම.<br>• සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීතිමය සහ නියාමන රාමු ශක්තිමත් කිරීම. ඊට අමතරව, රැකියා සඳහා විදේශගත වන කාන්තාවන්ට ප්‍රමාණවත් සහයෝගයක් ලබා දීම. මෙයට රජයේ විවිධ අමාත්‍යාංශ අතර හරස්-ආංශික සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම ඔස්සේ සියලුම සංක්‍රමණික සේවකයින්ගේ පවුල්වලට සහය වීම ද ඇතුළත් වේ.<br>• සංක්‍රමණික සේවකයින්ගේ ඡන්ද අයිතිය පිළිගැනීම සඳහා නීතිමය විධිවිධාන හඳුන්වා දීම. මෙයට සංක්‍රමණික සේවකයින්ට දැනට ඔවුන් පදිංචිව සිටින රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ/කොන්සල් කාර්යාලයේ ලියාපදිංචි වීමට ක්‍රමවේදයක් සහ මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවේ දී ඔවුන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට ඉඩ සලසන ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කිරීම ඇතුළත් වේ. |

| නියෝජනය, සංහිඳියාව සහ අනන්‍යතාවය | |
|---|---|
| **දේශපාලන නියෝජනය සහ නායකත්වය** | • දේශපාලනය තුළ ඉහළ මට්ටමේ කාන්තා සහභාගීත්වයක් සඳහා ඉඩ සලසන පරිසරයක් නිර්මාණය කිරීම.<br>• 2017 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හරහා පළාත් පාලන මැතිවරණවල දී කාන්තාවන් සඳහා 25%ක කෝටාව හඳුන්වාදීම ධනාත්මක පියවරක් වන අතර, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ සවි බලගැන්වීමේ මුලපිරීම් එහි කාර්යක්ෂමතාව සහතික කිරීම පිණිස සමානව වැදගත් වේ.<br>• 2018 පළාත් පාලන මැතිවරණයේ දී මෙම කෝටාව ක්‍රියාත්මක කිරීම සමාරම්භයේ දී බලාපොරොත්තුවක් ඇති කළ ද, අභියෝග මතුවනු දක්නට ලැබිණි. මෙහි දී දේශපාලන පක්ෂ විසින් "රූකඩ අපේක්ෂකයින්" නම් කළ බවට වාර්තා ඉදිරිපත්ව ඇති අතර, එවැනි මුලපිරීම්වල අවංකභාවය පිළිබඳව සැක |

| | |
|---|---|
| | පහළ වීමටත්, කාන්තා නියෝජනය බොහෝ අවස්ථාවන් හී දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා සැබෑ ලෙසම කැප වූවකින් ඔබ්බට ගොස් සංකේතාත්මක වැදගත්කමක් ඇති දෙයක් පමණක් ය යන ඇඟවුම ලබා දීමටත් හේතු වී තිබේ. ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත අන්තර්කරණ සහ නියෝජන වැඩ පිළිවෙල සාර්ථක වීමට නම්, තේරී පත් වූ නියෝජිතයන් කේවල් කිරීමේ දී සද්භාවයෙන් කටයුතු කිරීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය වඩා හොඳින් ක්‍රියාවට නැංවීම සඳහා අඛණ්ඩව කටයුතු කිරීමටත්, කැමැත්තෙන් පසුවිය යුතු ය. |
| සංහිඳියාව සහ අනන්‍යතාවය | • අතුරුදහන් වූවන් පිළිබඳ ස්වාධීන කාර්යාලයක් පිහිටුවීම සහ වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම වැනි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම ඇතුළුව ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ගේ සත්‍යය සහ යුක්තිය සඳහා වන ඉල්ලීම් ආමන්ත්‍රණය කිරීම.<br><br>• සංක්‍රාන්ති යුක්තිය සහ ප්‍රතිසන්ධාන උත්සාහයන් වැනි ගැටලු සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රධාන වශයෙන් සලකා බැලෙන බවට සහතික කිරීම. මෙම ක්ෂේත්‍රවල ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ දී ඒ පිළිබඳ ස්ත්‍රී පුරුෂ දෘෂ්ටිකෝණයෙන් සලකා බැලීමට කටයුතු කළ නේපාලය සහ කොලොම්බියාව වැනි සංසන්දනාත්මක පශ්චාත් යුධ සන්දර්භයන්ගෙන් උගත් පාඩම් ඇතුළත් කළ යුතු ය.<br><br>• ආරක්ෂාව, රැකියාව, අධ්‍යාපනය, ආහාර, ජලය සහ ඉඩම් වැනි මූලික අයිතිවාසිකම්වලට ප්‍රවේශ වීමට නොහැකි ජනවාර්ගික සුළුතර කාන්තාවන් සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ද ඇතුළුව, අනෙකුත් ආන්තික කණ්ඩායම් විසින් මුහුණ දෙන වෙනස්කම් කිරීම්වලට භාජනයවීම් ආමන්ත්‍රණය කිරීම.<br><br>• කාන්තාවන්ගේ, විශේෂයෙන් සුළුතර ප්‍රජාවන්ට අයත් කාන්තාවන්ගේ අන්තර්ඡේදනීයඅනන්‍යතාවන්ට ගරු කිරීම සඳහා අවැසි යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. |